# 8 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

## 18 - වාක්‍ය රීති ii



## නිපුණතාව 6.0 :

සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

## නිපුණතා මට්ටම 6.5 :

සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

## ක්‍රියාකාරකම් (01) :

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පදය වරහනින් තෝරා ලියන්න.


1. මම පාඩම් ...............(කරමි/කරමු)

2. ඈ ගමනක් ............ (යන්නීය/ගියේය)

3. ළමයි ගීත ගායනා ............ (කළෝය/කළාය)

4. මව දරුවා ............ (නැළවූවා ය/නැළවූවේය)

5. නුඹ රෙදි ............ (සේදුවෙහි/සේදුවෙහු)



# ක්‍රියාකාරකම් (02) :

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු නාම පදය වරහනින් තෝරා ලියන්න.

1. ........... නැටුම් බැලුවෙමු. (අපි/අප)

2. ........... සුවසේ නිදා සිටින්නීය. (දරුවා/දැරිය

3. ............... පාඩම ඉගැන්වුවේ ය. (ගුරුතුමා/ගුරුතුමිය)

4. ............... අහසේ පියඹා ගියේය. (කුරුල්ලා/කිරිල්ලී)

5. ............... පන්සල් ගියෙහු. (තොපි/තොප)



## ක්‍රියාකාරකම් (03):

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුර වරහනින් තෝරා යටින් ඉරක් අඳින්න.


1. එළදෙන තම (පැටවු/පැටවුන්) සොයා ගියාය.

2. අම්මා (මම/මා) සමග පොළට ගියාය.

3. ගෙවිලිය(ගවයෝ/ගවයින්) බැන්දාය.

4. ධීවරයෝ දැල් දමා (මත්ස්‍යයින්/මත්ස්‍යයෝ) ඇල්ලුවෝය.

5. මහ සුළඟට (ගස්/ගස්හු) කඩා ගෙන වැටුණි.



## ක්‍රියාකාරකම් (04) :

**පහත සඳහන් උක්ත පදවලට ගැළපෙන අනුක්ත පද  යා කරන්න.**

| | |
|---|---|
| 1. රජ්ජුරුවෝ | මලණුවන් |
| 2. වඳුරෝ | මිනිසුන් |
| 3. මලණුවෝ | ඇතුන් |
| 4. ඇත්තු | රජ්ජුරුවන |
| 5. මිනිස්සු | වඳුරන් |



## ක්‍රියාකාරකම් (05) :

මුලින් දී ඇති පදයට අදාළ පුරුෂය නම් කොට උක්ත/අනුක්ත බව පෙන්වීමට අදාළ කොටුව තුළ හරි ලකුණ යොදන්න.

| නාම පදය | අයත් පුරුෂය | උක්ත පදය | අනුක්ත පදය |
| --- | --- | --- | --- |
| තොපි | | | |
| මම | | | |
| තා | | | |
| අපි | | | |
| ඇතා | | | |
| ගොවීහු | | | |
| ගංගාවෝ | | | |
| ඔවුන් | | | |

## ක්‍රියාකාරකම් (06) :

පහත සඳහන් උක්ත පදවලට ගැළපෙන අනුක්ත පද රවුම තුළින් තෝරා වගු ගත කරන්න.

| උක්ත පදය | අනුක්ත පදය |
|---|---|
| රජෙක් | |
| වලසෙක් | |
| මලක් | |
| දූවක් | |
| පොතක් | |
| මාලිගාවක් | |
| පුතෙක් | |
| කාන්තාවක් | |

රජෙකු / මාලිගාවක්/
වලසෙකු/ පුතෙකු /
කාන්තාවක / දූවක/
පොතක් / මලක්

# පිළිතුරු

ක්‍රියාකාරකම් :

(01)

1. කරමි
2. යන්නීය
3. කළෝය
4. නැළවූවාය
5. සේදුවෙහි

(02)

1. අපි
2. දැරිය
3. ගුරුතුමා
4. කුරුල්ලා
5. තොපි

(03)

1. පැටවුන්
2. මා
3. ගවයින්
4. මත්සයින්
5. ගස්

(04)

1. රජ්ජුරුවන්
2. වඳුරන්
3. මලණුවන්
4. ඇතුන්
5. මිනිසුන්

## ක්‍රියාකාරකම් (05) :

| නාම පදය | අයත් පුරුෂය | උක්ත පදය | අනුක්ත පදය |
|---|---|---|---|
| තොපි | මධ්‍යම | ✓ | |
| මම | උත්තම | ✓ | |
| තා | මධ්‍යම | | ✓ |
| අපි | උත්තම | ✓ | |
| ඇතා | ප්‍රථම | ✓ | |
| ගොවීහු | ප්‍රථම | ✓ | |
| ගංගාවෝ | ප්‍රථම | ✓ | |
| ඔවුන් | ප්‍රථම | | ✓ |

## ක්‍රියාකාරකම් (06) :

| උක්ත පදය | අනුක්ත පදය |
| --- | --- |
| රජෙක් | රජෙකු |
| වලසෙක් | වලසෙකු |
| මලක් | මලක් |
| දුවක් | දුවක |
| පොතක් | පොතක් |
| මාලිගාවක් | මාලිගාවක් |
| පුතෙක් | පුතෙකු |
| කාන්තාවක් | කාන්තාවක |